# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,801 - 2013 මාර්තු මස 08 වැනි සිකුරාදා - 2013.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 366 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 372 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මාර්තු මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මාර්තු මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
මෙම ගැසට් පත්‍රය *www. douments. gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

363 - B 80697—9,000 (2013/03)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙනආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අප්‍රේල් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 පෙබරවාරි මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| පුත්තලම | නාත්තන්ඩිය | නාත්තන්ඩිය කොට්ඨාසයේ උප්පැන්න, හා මරණ සහ දකුණු පිටිගල් කෝරළේ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |

03-384

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු- අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අප්‍රේල් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 පෙබරවාරි මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අනුරාධපුර | ඉපලෝගම | කළාගම් පළාත කොට්ඨාසයේ කල්ලංචිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

03-385

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — වවුනියාව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අප්‍රේල් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 පෙබරවාරි මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| වවුනියාව | වවුනියාව | වවුනියාව නගරය කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය. (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව. |

03-315

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අප්‍රේල් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 පෙබරවාරි මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | කොත්මලේ | තිස්පනේ කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ කොත්මලේ කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

03-313

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අප්‍රේල් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 පෙබරවාරි මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ හිරිඹුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

03-316

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අප්‍රේල් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 පෙබරවාරි මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කුරුණෑගල | අලව්ව | දඹදෙණි උඩුකහ නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ දඹදෙණි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | මල්ලවපිටිය | තිරගන්දහය නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වැළඩිවිල්ලි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | -එම- |
| කුරුණෑගල | කුලියාපිටිය බටහිර | කටුගම්පල හත්පත්තුව කුලියාපිටිය නගර කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | -එම- |

03-314

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා 3 පන්තියේ නිලධාරීන් උසස් කිරීම**

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථානයන්හි ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යාපන ලේකම් විසින් අයදුම්පත් භාරගනු ලැබේ.

2.0 මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.04.02 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා 3 පන්තියේ නිලධාරීන් උසස් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියේ සේවයේ නියුක්ත පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*3.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 12.1 හා 12.6 සිට 12.12 දක්වා වගන්ති අදාළ වේ.

3.2 නේවාසික පහසුකම් සළසා ඇතිවිට අධ්‍යාපන විද්‍යාපීඨ සීමාව තුළ පදිංචි විය යුතුය.

3.3 තනතුරු සඳහා තෝරාගනු ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් සේවයේ අවශ්‍යතා අනුව කුමන අධ්‍යාපන විද්‍යාපීඨයක, ගුරු විද්‍යාලයක හෝ ගුරු මධ්‍යස්ථානයක වුව ද සේවය කිරීමට බැඳී සිටී. මෙම ගැසට් පත්‍රයේ I කොටස දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

*4.0 අයදුම් කිරීමට සුදුසුකම් :*

4.1 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 17 වැනි වගන්තිය අනුව උපාධිය ලබා ඇත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොවේ නම් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස අ. පො. ස. (සා. පෙළ) හෝ සමාන විභාගයක දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ එයට උසස් සහතිකයක් ලබා තිබීම අවශ්‍යතාවක් වනු ඇත. මෙම සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම.

*5.0 අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

*5.1 ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණිය :*

5.1.1 ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තිය යටතේ උපලේඛනගත තනතුරක වසර 07කට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණ කර සේවයේ ස්ථිර කර තිබීම ; සහ

5.1.2 පිළිගත් විශ්ව විද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ පළමු පංතියේ හෝ 2 වැනි පංතියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ (ඉහළ) උපාධියක් ලබා තිබීම ; හෝ

5.1.3 පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය ක්ෂෙත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ඨ හෝ සම්මාන හෝ සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්ෂෙත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම; හෝ

5.1.4. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පංතියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්ෂෙත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

*6.0 වැටුප් පරිමාණය :*

6.1 වැටුප් පරිමාණය SL 1-2006

*7.0 තෝරා ගැනීමේ ක්‍රමය :*

7.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ලකුණු පරිපාටියකට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරාගනු ලැබේ.

7.2 වාර්ෂිකව ඇතිවූ පුරප්පාඩු ගණනය කර අනුපිළිවෙලින් සම්පූර්ණ කරනු ලැබේ.

7.3 *සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ පහත සඳහන් ලිපිලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :*

7.3.1 උප්පැන්න සහතිකය (උපකෘත පාසල්වලට ඇතුළත් කිරීමේ නීති යටතේ නිකුත් කර ඇති උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතිකය හෝ පිළිගනු නොලැබේ.)

7.3.2 උපාධි සහතික සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ අනෙකුත් සහතික

7.33 වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික

7.34 සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා දැනුම පිළිබඳව ලබා ඇති අ. පො. ස. (සා/පෙළ) හා අනෙකුත් සහතික

7.4 පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් සංඛ්‍යාවක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

7.5 උසස්වීමේ දිනට හෝ වසර 05 තුළ දඬුවමකට භාජනය නොවීමෙන් හා වැටුප් වර්ධක උපයා ගැනීමෙන් සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

7.6 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමිත පරිදි,

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 22 වැනි දින.

***ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II පන්තියේ පුරප්පාඩු සඳහා 3 පන්තියේ නිලධාරීන් උසස් කිරීම***
***ආදර්ශ අයදුම්පත්‍රය***

(A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය.)

01. (i) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(හිමි/මයා/මිය/මෙය)
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.
(iii) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(Rev/Mr./Mrs/Miss)
(iv) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) රාජකාරි ලිපිනය (සිංහලෙන්) :————.
(ii) රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(iii) පෞද්ගලික ලිපිනය (සිංහලෙන්) :————.
(iv) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(v) පෞද්ගලික දුරකථන අංකය :————.

03. (i) උපන් දිනය :————.
(ii) 2013.04.02 දිනට වයස : අවුරුදු [ ] මාස [ ] දින [ ]

04. ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | | ]

05. ඔබ අයත් ජන වර්ගය :————.

06. (i) මුල් පත්වීමේ දිනය හා තනතුර :————.
(ii) වර්තමාන තනතුර හා එයට පත්වූ දිනය :————.
(iii) වර්තමාන සේවා ස්ථානය :————.
(iv) විශ්‍රාම ලබා ඇත්නම් එම දිනය :————.
(v) ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් දිනය :————.

07. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

(i) පළමු උපාධිය :

| *උපාධියේ නම හා නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *පන්තිය* | *විශිෂ්ඨ/සම්මාන/සාමාන්‍ය ද යන වග* |
|---|---|---|---|
| | | | |

(ii) පශ්චාත් උපාධිය

| *සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *පන්තිය* | *විශිෂ්ඨ/සම්මාන/සාමාන්‍ය ද යන වග* |
|---|---|---|---|
| | | | |

(iii) අධ්‍යාපන ඩිප්ලෝමාව :

| *සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය* | *පාඨමාලාවට ගත වූ කාලය* | *විශිෂ්ඨ ද සම්මාන ද යන වග* | *විෂයයන් පිළිබඳ විස්තරය* |
|---|---|---|---|
| | | | |

(iv) වෙනත් වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා සහතික හා පුහුණු ගුරු සහතික පිළිබඳ විස්තර) :

| *සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය* | *පාඨමාලාවට ගතවූ කාලය* | *විෂයයන් පිළිබඳ විස්තර* |
|---|---|---|
| | | |

(v) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව :

| අ. පො. ස. සා/පෙළ | ප්‍රතිඵල වලංගු දිනය | සාමාන්‍යය/සම්මාන/ අධි සම්මාන |
|---|---|---|
| | | |

(vi)

| ඉංග්‍රීසි විෂයට අදාළව ලබා ඇති වෙනත් ප්‍රවීණතා | නිකුත් කළ ආයතනය හා වලංගු දිනය | ශ්‍රේණිය |
|---|---|---|
| | | |

(vi) සේවා පිළිබඳ විස්තර (මුල් පත්වීමේ සිට)

| ආයතනය | තනතුර | විෂයය | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

09. දැනට ඔබට විරුද්ධව දෙපාර්තමේන්තුමය විනයානුකූල පරීක්ෂණයක් පවත්වන්නේ ද? නැතහොත් අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න.)

10. මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති සියලුම තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි දී ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් ඒ මත මා මෙම තනතුර ලැබීමට නුසුදුස්සකු බවට තීරණය කරන බවත්. පත්වීම ලැබීමෙන් පසු මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියක් නොලබා තනතුරින් පහකිරීමට යටත්වන බව ද දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

................................... ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම ආයතනයේ ................. වශයෙන් සේවය කරන බවට/සේවය කර ............ දින විශ්‍රාම ලබා ඇති බවට සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
එම ප්‍රධානියා වෙනුවට බලය ලබා
ඇති නිලධාරියාගේ අත්සන.

දිනය :—————.

දෙපාර්තමේන්තුව :—————.

***ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියේ නිලධාරීන් 2-II ශ්‍රේණියට උසස් කිරීමේ ලකුණු පරිපාටිය***

ලකුණු ලබාදීම සඳහා අදාළ සුදුසුකම් පුරප්පාඩුව ඇති වූ දිනට පෙර සපුරා තිබිය යුතුය.

1.0 සේවා පළපුරුද්ද උපරිම ලකුණු 50

ශ්‍රී. ලං. ගු. අ. සේ. 3 පන්තියේ
වසර 07ට වැඩි අමතර සක්‍රීය සේවා
කාලය සඳහා එක් වසරකට
ලකුණු 10 බැගින් උපරිම වසර 05ක් සඳහා
ලබාදෙනු ලැබේ.

2.0 අතිරේක අධ්‍යාපන සුදුසුකම් උපරිම ලකුණු 15

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-ii ට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 2.1 | උපාධිය | 05 |
| 2.2 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 10 |
| 2.3. | පශ්චාත් උපාධිය | 15 |

03. ශාස්ත්‍රීය කාර්ය සාධනය උපරිම ලකුණු 10

උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධියට ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු ලබා දෙනු නොලැබෙන අතර එක් ප්‍රකාශනයක් සහ එක් පර්යේෂණයක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 3.1. | පර්යේෂණ | |
| 3.1.1. | විධිමත්ව සැකසූ පර්යේෂණ වාර්තාව (අවසන් වාර්තාව) | 02 |
| 3.1.2 | රැකියා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයක් වීම | 01 |
| 3.1.3 | ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කර තිබීම | 02 |
| 3.2. | ප්‍රකාශන | |
| 3.2.1 | විෂයානුබද්ධ ප්‍රකාශන (පුවත්පත් වාර සඟරා ආදියේ ප්‍රසිද්ධියට පත් කළ) | 03 |
| 3.3.2. | විෂයානුබද්ධ පොත් පළ කිරීම | 02 |

04. තොරතුරු තාක්ෂණ හැකියාව උපරිම ලකුණු 10
(පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික සඳහා පමණක් ලකුණු හිමිවේ.)

| | | |
|---|---|---|
| 4.1 | මාස 06ක් හෝ ඊට වැඩි තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා | 05 |
| 4.2 | වසර 01 හෝ ඊට වැඩි තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් සඳහා | 10 |

05. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවාව තුළ ලබාගත් සේවා ඇගයීම් උපරිම ලකුණු 05

| | | |
|---|---|---|
| 5.1 | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නියමිත ආකෘතියෙන් විධිමත් සේවා ඇගයීම් හා ප්‍රශංසා ලිපි | 05 |

06. භාෂා දැනුම උපරිම ලකුණු 10

(රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික සඳහා පමණක් ලකුණු හිමිවේ.)

ඉංග්‍රීසි භාෂාව

| | | |
|---|---|---|
| 6.1 | මාස 06ක් හෝ ඊට වැඩි කාලයක ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් සඳහා | 05 |
| 6.2 | වසර 01 හෝ වසර 01ට වැඩි කාලයක ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් සඳහා | 10 |

මුළු ලකුණු 100

03-511

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය - 2013 (අප්‍රේල්/මැයි) සිංහල/දෙමළ - I/II/III වන මට්ටම

(ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2007 හා 07/2007 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගය සඳහා රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. 07/2007 චක්‍රලේඛයට අනුව වසර 05ක් තුළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු අර්ධ රාජ්‍ය සේවයේ නිලධාරින්ට හා ගුරුවරුන්ට ද මෙම විභාගයට ඉල්ලුම් කළ හැකිය. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

02. මෙම විභාගය ලිඛිත හා වාචික යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අතර, එය සමත්වන අයට පමණක් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් වාචික පරීක්ෂණය පවත්වනු ලැබේ. ඒ සඳහා ද මෙම අයදුම්පත්‍රයේ තොරතුරු අදාල කරගනු ලැබේ. ( මෙම විභාගයේ පිළිතුරු පත් නැවත සමීක්ෂණය නොකෙරේ.)

| | *විභාගය* | *භාෂාව* | *මට්ටම* |
|---|---|---|---|
| 1. | රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය | සිංහල/දෙමළ | III වන මට්ටම (පහළ මට්ටම) |
| 2. | රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය | සිංහල/දෙමළ | II වන මට්ටම (මධ්‍යම මට්ටම) |
| 3. | රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය | සිංහල/දෙමළ | I වන මට්ටම (ඉහළ මට්ටම) |

*සටහන :* * තම සේවයට අදාළ වන්නා වූ මට්ටම ඉහත චක්‍රලේඛ අනුව නිශ්චය කර එම මට්ටමේ විභාගයට පෙනී සිටීමට හැකි ය.

* එක් අයදුම්කරුවෙකුට එක් වරකදී ඉල්ලුම් කළ හැක්කේ එක් භාෂාවක එක් මට්ටමකට පමණි.

* ඒ ඒ භාෂා ප්‍රවීණතා මට්ටම් සඳහා පෙනී සිටිය යුතු ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව හා කාලය පිළිබඳ තොරතුරු ඇමුණුම් අංක 01හි සඳහන් කර ඇත.

03. මෙම ලිඛිත විභාගවලට අදාළ විෂය නිර්දේශ, ඉල්ලුම්පත් ආකෘතිය හා අදාළ විස්තර රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය. එසේම ලිඛිත විභාගයේ ප්‍රතිඵල ඒ ඒ අපේක්ෂකයන් වෙත දන්වා නොයැවෙන අතර, එම ප්‍රතිඵල ද ඉහත වෙබ් අඩවියට මුදා හැරේ. (විභාග අංකය මඟින් පමණක් ප්‍රතිඵල පරීක්ෂා කළ හැකි බැවින් තම විභාග අංකය සටහන් කර තබා ගැනීම ඉතා වැදගත් වේ.)

04. ලිඛිත විභාගය සඳහා දිවයිනේ ඒ ඒ පළාත්වල විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක ඇමුණුම් 01 හි සඳහන් වේ. යම් නගරයටකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම විභාග මධ්‍යස්ථාන අවලංගු කර, අයදුම්කරුවන් ඉල්ලා ඇති දෙවන/තුන්වන කැමැත්තකට අනුව විභාග මධ්‍යස්ථාන වෙත යොමු කෙරේ. ලිඛිත විභාගයට පෙනී සිටින නගරය අයත් දිස්ත්‍රික්කය වාචික පරීක්ෂණය සඳහා ද අදාළ කරගනු ලැබේ. එබැවින් විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

05. අදාළ ආකෘතිය අනුව සහ පහත සඳහන් උපදෙස්වලට අනුකූල වන සේ ඉල්ලුම්පත සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශය හා නිල මුද්‍රාව සහිතව 2013 අප්‍රේල් 08 දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය - 2013 අප්‍රේල්/මැයි" යනුවෙන් සඳහන් කළ යුතුය.

06 ඉල්ලුම් පත්‍රයේ අංක 1 සිට 6 තෙක් පළමු පිටුවට ද ඉතිරි කොටස දෙවන පිටුවට ද වන ලෙස ගෙන, සකස් කළයුතු අතර ඉල්ලුම්පත තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

07. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන හෝ උපදෙස්වලට පටහැනි හෝ අසම්පූර්ණ වූ හෝ අවසාන දිනට පසුව එවනු ලබන්නාවූ හෝ ඉල්ලුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ඔබට ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් කරන භාෂාව හා ප්‍රවීණතා මට්ටම පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08 එක් භාෂා ප්‍රවීණතා මට්ටමකට පළමුවරට ඉල්ලුම්කරන අපේක්ෂකයින්ගෙන් විභාග ගාස්තුවක් අය නොකෙරේ. එසේ නොවන අයදුම්කරුවන්ගෙන් රු. 300 ක විභාග ගාස්තුවක් අය කෙරේ. එම විභාග ගාස්තුව දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඉල්ලුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තු "20.03.99.00 - වෙනත් ආදායම්" යන ආදායම් ශීර්ෂ අංකයට බැර කළ යුතු වේ.

09 අපේක්ෂකයින් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවද ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක්ද අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපතක්ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍ර එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඔබගේ ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යැවීම වඩාත් ඵලදායි වනු ඇත.

10. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි. යම් හෙයකින් එසේ අනන්‍යතාව තහවුරු නොකොට විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ ඒ පිළිබඳ විමර්ශනයක් සිදුකිරීමෙන් පසුව අනන්‍යතාව තහවුරු වන්නේ නම් පමණි.

12. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට අපේක්ෂකයින්ගේ පැවති තනතුර සහ සේවා ස්ථානය විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් පිළිබඳව කිසිවක් සලකා බලනු නොලැබේ.

13. මෙම ලිඛිත විභාගය සම්බන්ධයෙන්, ඉහත සඳහන් නොවන කරුණු පිළිබඳ අවසාන තීරණය අදාළ පරිදි විභාග කොමසාරිස් ජනරාල් හා/හෝ රාජ්‍ය භාෂා කොමසාරිස් සතුය.

14. ලිඛිත විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. වැඩි විස්තර සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දුරකථන අංක 011-2889506, 011-2888934 - 220 අමතන්න. ප්‍රවේශපත්‍ර ගැටලු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ 011-2785230 හෝ 011-2177075 යන දුරකථන අංකවලට යොමු කළ යුතුය.

ජේ. ඩී. සී. ජයසිංහ,
රාජ්‍ය භාෂා කොමසාරිස්.

2013 පෙබරවාරි මස 22 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
"භාෂා මන්දිරය"
අංක 341/7, කෝට්ටේ පාර,
රාජගිරිය.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|
| ................................... |

**රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය - 2013 (අප්‍රේල්/මැයි)**
සිංහල/දෙමළ (I, II, III මට්ටම)

**විභාග දෙපාර්තමේන්තුව/රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

Written Examination for Official Language Proficiency - 2013 (April/May)
Level, I, II, III (Sinhala/Tamil) — Department of Examination, Sri Lanka/Department of Official languages

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන
නගරය හා නගර අංකය (කැමැත්තේ අනුපිළිවෙලට)
(නිවේදනයේ අංක 01 ඇමුණුමට අනුව)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

ඉල්ලුම් කරන භාෂාව :
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන මට්ටම
I. මට්ටම (ඉහළ) - 1
II. මට්ටම (මධ්‍යම) - 2
III. මට්ටම (පහළ) - 3

1. අයදුම්කරුගේ නම :————.
(මුලකුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : GAMINI H. W.)

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. ලිපිනය :

(i) රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍රය, ප්‍රතිඵල සහ සහතික පත් මෙම ලිපිනයට තැපැල් කෙරේ.)

(ii) ස්ථිර පදිංචි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

4. දිස්ත්‍රික්කය :

(i) සේවා ආයතනය අයත් දිස්ත්‍රික්කය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) සේවා ආයතනය අයත් දිස්ත්‍රික්ක අංකය : ☐
(නිවේදනයේ අංක 01 ඇමුණුමට අනුව)

5. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐
පුරුෂ 0
ස්ත්‍රී 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

6. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

8. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

9. ඔබගේ තනතුර : (i) සම්පූර්ණ තනතුර/සේවා නාමය ලියන්න. :————.

(ii) තනතුර අයත් සේවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) ☐

| | | | |
|---|---|---|---|
| මධ්‍යම රාජ්‍ය සේවය | - 1 | අර්ධ රාජ්‍ය සේවය | - 3 |
| පළාත් රාජ්‍ය සේවය | - 2 | වෙනත් | - 4 |

10. මීට පෙර පැවැත් වූ භාෂා ප්‍රවීණතා ලිඛිත පරීක්ෂණවලට මෙම මට්ටම සඳහා ඔබ පෙනී සිටියෙහි ද? ඔව්/නැත

පෙනී සිටියේ නම් :

විභාග අංකය :————. විභාග දිනය :————.

11. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.

ගැසට් නිවේදනයේ අංක 08 ඡේදය අනුව විභාග ගාස්තු ගෙවූයේ නම් එම ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අත්‍යාවශ්‍ය වනු ඇත.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, මෙම භාෂාව සම්බන්ධයෙන් වෙනත් මට්ටමක් සඳහා ඉල්ලුම් කර නැති බවත්, විභාගයට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන්, විභාග කොමසාරිස් ජනරාල් හා/හෝ රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගන්නා බවත්, විභාග නීතිරීතිවලට යටත් වන බවත් ප්‍රකාශ කරමි.

අත්සන :————. (ආයතන ප්‍රධානියා ඉදිරිපිට දී අත්සන තබන්න.)

නම :————.

දිනය :————.

---

ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත අයදුම්කරු මාගේ කාර්යාලයේ සේවය කරන බවත්, ඉල්ලුම්පත්‍රයේ අංක I - II ඡේදයන්හි සඳහන් තොරතුරු නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත්, ඔහුගේ/ඇයගේ අත්සන .................. දින මා ඉදිරිපිට දී තබන ලද බවත් සහතික කරමි.

අත්සන :————. දිනය :————.
නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.

ඇමුණුම - 01

විභාග මධ්‍යස්ථානය පිහිටුවන දිස්ත්‍රික්ක/නගර හා දිස්ත්‍රික් අංක/නගර අංක

| පළාත | දිස්ත්‍රික්කය/නගරය | දිස්ත්‍රික් අංකය/ නගර අංකය |
|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | 1 |
| | ගම්පහ | 2 |
| | කළුතර | 3 |
| වයඹ පළාත | කුරුණෑගල | 4 |
| | පුත්තලම (හලාවත) | 5 |
| දකුණු පළාත | ගාල්ල | 6 |
| | මාතර | 7 |
| | හම්බන්තොට (තංගල්ල) | 8 |
| සබරගමු පළාත | රත්නපුර | 9 |
| | කෑගල්ල | 10 |
| ඌව පළාත | බදුල්ල | 11 |
| | මොණරාගල | 12 |
| මධ්‍යම පළාත | මහනුවර | 13 |
| | මාතලේ | 14 |
| | නුවරඑළිය | 15 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 16 |
| | පොළොන්නරුව | 17 |
| උතුරු පළාත | යාපනය | 18 |
| | වවුනියාව | 19 |
| | මුලතිව් | 20 |
| | කිලිනොච්චිය | 21 |
| | මන්නාරම | 22 |
| නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය | 23 |
| | මඩකලපුව | 24 |
| | අම්පාර | 25 |

විභාග පටිපාටිය :

| භාෂා මාධ්‍ය | මට්ටම | ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව | කාලය | විභාගය සමත්වීම සඳහා ලබාගතයුතු අවම ලකුණු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | | | ලිඛිත | වාචික |
| සිංහල | III මට්ටම | 01 පත්‍රය | පැය 02 | 40න් 16 | 60න් 24 |
| සිංහල | II මට්ටම | 01 පත්‍රය<br>02 පත්‍රය | පැය 03<br>පැය 03 | 70න් 28 | 30න් 12 |
| සිංහල | I මට්ටම | 01 පත්‍රය<br>02 පත්‍රය | පැය 03<br>පැය 03 | 70න් 28 | 30න් 12 |
| දෙමළ | III මට්ටම | 01 පත්‍රය | පැය 02 | 40න් 16 | 60න් 24 |
| දෙමළ | II මට්ටම | 01 පත්‍රය<br>02 පත්‍රය | පැය 03<br>පැය 03 | 70න් 28 | 30න් 12 |
| දෙමළ | I මට්ටම | 01 පත්‍රය<br>02 පත්‍රය | පැය 03<br>පැය 03 | 70න් 28 | 30න් 12 |

03-529

---

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු සඳහා වෘත්තීය සුදුසුකම් මත කුසලතා පදනමින් සෘජු බඳවා ගැනීම් - 2012 (2013)**

අංක 1670/33 සහ 2010.09.10 වැනි දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.4 ඡේදයේ පරිදි උතුරු නැගෙනහිර පළාත් සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ අයදුම්පත් 2013.04.08 දින හෝ එදිනට පෙර, කොළඹ 01, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් (ඒ) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ "උතුරු නැගෙනහිර පළාත් සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා සෘජු බඳවා ගැනීම් අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය.* - III වැනි ශ්‍රේණියේ පුරප්පාඩු 09 ට නොවැඩි සංඛ්‍යාවකට පත් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති පුද්ගලයින්ගෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත නිලධාරීන් තෝරා ගනු ලැබේ. අපේක්ෂකයින් දෙමළ භාෂාවෙන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

03. *සේවා කොන්දේසි.*- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1670/33 සහ 2010.09.10 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කරනු ලබන සංශෝධන වලට ද, යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වැනි ශ්‍රේණියට පත් කරනු ලබයි. තව ද රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 07/2007 අනුව භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

3.1 තෝරා ගනු ලබන අය පත්වීම් දින සිට අවම වශයෙන් දස අවුරුද්දක් උතුරු සහ නැගෙනහිර පළාත්වල සේවය කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඔවුන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

3.2 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

04. පත්වීම් දිනයේ සිට වසර 03 ක් ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

*ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :*

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි එස්.එල්. 1-2006 වැටුප් ඛණ්ඩය අනුව මාසික වැටුප් පරිමාණය - රු. 22,935 - 10 x 645 - 8 x 790 -17 x 1050 - රු.53,555

05. *වෘත්තීය සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය,

හෝ

(ii) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක අවසාන පරීක්ෂණය,

හෝ

(iii) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයක අවසාන පරීක්ෂණය,

හෝ

(iv) සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය,

හෝ

(v) එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අවසාන පරීක්ෂණය සමත්ව තිබිය යුතු ය.

06. *කායික සුදුසුකම්.*—සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

07. *වෙනත් සුදුසුකම්.*— (i) ශ්‍රීලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිඳු තැනැත්තෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 7.4.3.3 පරිදි සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි;

(iv) *සුදුසුකම් ලබන දිනය* :
සේවයට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, ඉහත සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍යවන සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

08. වයස් සීමාව.–අයඳුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

09. පහත සඳහන් ලියවිලි අපේක්ෂකයෙකු විසින් සිය අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකයේ පිටපතක්;

(ආ) ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වල පිටපත්;

(ඇ) චරිත සහතික 2 ක් (මෙයින් එකක් විදුහල්පතිගෙන්/විශ්ව විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය);

10. කුසලතා මත සෘජු බඳවා ගැනීමේ දී ලකුණු දීමේ ව්‍යුහගත ලකුණු දීමේ පරිපාටිය :

(අ) අධ්‍යාපන සුදුසුකම් : උපරිම 20

| | අධ්‍යාපන සුදුසුකම් | ලකුණු |
|---|---|---|
| (i) | සාමාන්‍ය උපාධිය | 08 |
| (ii) | විශේෂ උපාධිය | 09 |
| (iii) | 2 වැනි පෙළ සහිත සාමාන්‍ය උපාධිය | 09 |
| (iv) | 2 වැනි පෙළ සහිත විශේෂ උපාධිය | 11 |
| (v) | 1 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය | 11 |
| (vi) | 1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය | 12 |
| (vii) | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 |
| (viii) | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ගිණුම් හෝ විගණනය විෂයක් සහිත | 15 |
| (ix) | ශාස්ත්‍රපති හෝ ඊට ඉහළ උපාධි | 15 |
| (x) | ශාස්ත්‍රපති හෝ ඊට ඉහළ උපාධි - ගිණුම් හෝ විගණනය විෂයක් සහිත | 20 |

(ආ) *වෘත්තීය සුදුසුකම්* : උපරිම 50

| | *වෘත්තීය සුදුසුකම්* | ලකුණු |
|---|---|---|
| (i) | ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියෙකු විය යුතු ය; | 15 |
| (ii) | වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික/ අන්තර් මාධ්‍ය පරීක්ෂණය, වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ 11 වැනි අදියර පරීක්ෂණය සමත්වීම හෝ සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය 1 වැනි කොටසේ පරීක්ෂණය සමත්වීම | 20 |
| (iii) | වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන 1 කොටසේ පරීක්ෂණය සමත්වීම, වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ 111 වැනි අදියර පරීක්ෂණය සමත්වීම හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ වෘත්තීය 11 වැනි කොටසේ පරීක්ෂණය සමත්වීම | 30 |
| (iv) | වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම හෝ වෙනත් යම් පිළිගත් වෘත්තීය සුදුසුකම් | 40 |
| (v) | වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජිකත්වය ලබා තිබීම හෝ වෙනත් යම් පිළිගත් වෘත්තීය සුදුසුකම් | 50 |

(ඉ) පරිගණක සාක්ෂරතාව උපරිම 10

| පරිගණක සාක්ෂරතාව | ලකුණු |
|---|---|
| (i) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පරිනමනු ලබන පරිගණක ධාවන බලපත්‍රය (Computer Driving License) | 4 |
| (ii) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක මාස තුනකට නොඅඩු පරිගණක පාඨමාලාවක් සමත්ව තිබීම හා සහතිකයක් ලබා තිබීම; | 5 |
| (iii) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය මගින් පරිනමනු ලබන පරිගණක ඩිප්ලෝමා | 6 |
| (iv) විශ්ව විද්‍යාලයක් මඟින් පරිනමනු ලබන පරිගණක ඩිප්ලෝමා | 8 |
| (v) ඉහත (iv) හි සඳහන් සුදුසුකමට ඉහළ වෙනත් යම් සුදුසුකම් | 10 |

(ඊ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා උපරිම 05

"සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීමේදී දක්වන කුසලතාවය සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන පරිදි මෙම ලකුණු ප්‍රදානය කරනු ලැබේ."

(උ) අදාළ ක්ෂේත්‍රය තුල සේවා පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 15

එකතුව ලකුණු 100

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලැබේ.

11. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත නිලධාරියෙකු විසින් තමාගේ අයදුම්පතෙහි මුල් පිටපත ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් (ඒ), මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, කොළඹ 01 යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. එහි පිටපතක් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම කෙලින්ම මෙම ලිපිනයට එවීමට පුළුවන.

12. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතු අතර එය ඒ4 ප්‍රමාණයේ කඩදාසියක අපේක්ෂකයා විසින්ම සකස් කළ යුතු ය.

(ආ) ඉල්ලුම්පතේ අංක 01 සිට 05 දක්වා කරුණු මුල් පිටුවේ සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතුය. කෙසේ වෙතත් ඉල්ලුම්පත්‍රය සකස් කරන විට එහි ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර නොමැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. තැපෑලේ දී ඉල්ලුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ පිළිබඳව කෙරෙන අභියාචනා කිසිවක් සලකා බලනු නොලැබේ.

(ඈ) අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින්ම යටපත් කර ඇත්නම්, පත්වීමක් ලැබීමට ඔහු/ඇය නුසුදුස්සකු වීමට ඉඩ ඇත. රජයේ සේවයට පත් කළ පසුව මෙබන්දක් හෙළිවුවහොත් සේවයෙන් පහ කළ හැකිය.

13. පවතින පුරප්පාඩු සියල්ල හෝ කොටසක් හෝ පිරවීම පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

14. තෝරාගනු ලබන අපේක්ෂකයකු තුන් අවුරුදු පරිවාස කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීමට පෙර පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතු ය.

(i) රජයේ මූල්‍ය පරිපාටි
(ii) නීතිය හා කළමනාකරණය
(iii) පරිපාලනය
(iv) වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

15. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට පත්වීම් කරනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි. නිලධාරියා තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සහ නියමිත සිංහල/දෙමළ ප්‍රවීණතා පරීක්ෂණය සමත්වී ඇති විට මෙම කාල සීමාව ඉක්මවීමෙන් අනතුරුව සේවය ස්ථිර කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2013 මාර්තු මස 08 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
මහා භාණ්ඩාගාරය, කොළඹ 01.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල තනතුරු
**වෘත්තීය සුදුසුකම් මත කුසලතා පදනමින් සෘජු බඳවා ගැනීම - 2012 (2013)**

අංකය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය : [ ]
දෙමළ - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01 1.1 මුලකුරු සමග නම: Mr./Mrs./Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : Mr. SILVA, A. B.
1.2 සම්පූර්ණ නම :————. (දෙමළෙන්)
1.3 සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

02 2.1 ස්ථිර ලිපිනය :————.
2.2 රාජකාරි ලිපිනය :————.
(රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියකු විසින් ඔහුගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වුණිනම්, එය වහාම දැන්විය යුතුය.)

03 3.1 උපන් දිනය :————.

3.2 2013.04.08 දිනට වයස :————.
අවුරුදු :————. මාස :————. දින :————.
(අයදුම්පත් භාරගන්නා අවසාන දිනට)

04. ස්ත්‍රී/පුරුෂ භාවය : | පුරුෂ | ස්ත්‍රී |

05. විවාහක/අවිවාහක භාවය : | විවාහක | අවිවාහක |

06. භාෂා ප්‍රවීණතාවය පිළිබඳ සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :

| (i) සිංහල | (ii) දෙමළ | (iii) ඉංග්‍රීසි |
|---|---|---|
| (1)<br>(2)<br>(3) | | |

07. අධ්‍යාපන, වෘත්තීය සහ කාර්මික සුදුසුකම් - (ලබා ගන්නා ලද ඉහළම උපාධි, විශිෂ්ට සාමාර්ථ,වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, පෙනී සිටි විෂයයන් සහ අදාළ ආයතනවල නම් සඳහන් කරන්න.) :- :————.

08. දැනට නිරත රක්ෂාව සහ ඊට ප්‍රථමයෙන් ඉසිලූ තනතුරු :- රක්ෂාවට බැඳුණු දිනය, ඉන් අස්වූ දිනය, අන්තිමට ලැබූ වාර්ෂික වැටුප හා සේවය අවසන් කිරීමට හේතු සඳහන් කරන්න.

| තනතුර | සිට | දක්වා | වාර්ෂික වැටුප (රුපියල්) | සේවය අවසන් කිරීමට හේතු |
|---|---|---|---|---|
| (1)<br>(2)<br>(3)<br>(4)<br>(5) | | | | |

09. ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලබා තිබේද? එසේනම් දිනය සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න :————.

10. තවත් තොරතුරු කිසිවක් වේ නම්, ඒවා :————.

11. චරිත සහතික ලබාගන්නා අය හැර ඔබ ගැන තොරතුරු විමසිය හැකි ඔබ ගැන හොඳින් දන්නා පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :
(1)
(2)

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍යය හෝ වැරදි බව දැනගතහොත් මා නුසුදුස්සකු වීමටත්, මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

අයදුම්කරු රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නම් ඔහු/ඇය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම ඉල්ලුම්පත ඉදිරිපත් කරන ................................................ මහතා/ මහත්මිය/මෙනෙවිය ....................වැනි දින සිට ............................................ කාර්යාලයේ රාජ්‍ය සේවකයෙක්/පළාත් රාජ්‍ය සේවකයෙක් ලෙස සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————.

03-422

---

## ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වැනි ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන සීමිත විශේෂ තරග විභාගය - 2012 (2013)

අංක 1798, 2013 පෙබරවාරි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II(අ) කොටස යටතේ පළවූ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන විශේෂ සීමිත තරග විභාගය 2012(2013) යටතේ පළවූ දැන්වීමේ -

1. විභාග දිනය යටතේ සඳහන් වූ විභාග කොමසාරිස් ජනරාල් විසින් 2013 අප්‍රේල් මස කොළඹ දී හා යාපනයේ දී විභාගය පවත්වනු ඇත. යන්න විභාග කොමසාරිස් ජනරාල් විසින් 2013 මාර්තු/අප්‍රේල් මස කොළඹ දී යාපනයේ දී විභාගය පවත්වනු ඇත යනුවෙන් සංශෝධනය විය යුතුය.

03-421/1

---

## ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වැනි ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන විශේෂ විවෘත තරග විභාගය - 2012

අංක 1755, 2012 අප්‍රේල් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II(අ) කොටස යටතේ පළවූ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන විශේෂ විවෘත තරග විභාගය 2012 යටතේ පළ වූ දැන්වීමේ -

3 වගන්තිය සේවා කොන්දේසි යටතේ 3.1 යටතේ සඳහන් වූ මෙම විභාගය මගින් පිරවීමට අපේක්ෂා කරන උතුරු සහ නැගෙනහිර පළාත්වල පුරප්පාඩු සංඛ්‍යාව 63 කි යන්න මෙම විභාගය මගින් පිරවීමට අපේක්ෂා කරන උතුරු සහ නැගෙනහිර පළාත්වල පුරප්පාඩු සංඛ්‍යාව 32කි යනුවෙන් සංශෝධනය විය යුතුය.

03-421/2

සංශෝධනයයි

**රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

2013.03.01 වැනි දින පළකරන ලද අංක 1800 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස : (IIඅ) ඡෙදය - විභාග, විභාග ප්‍රතිඵල ආදිය කොටසේ සඳහන් සංශෝධනයට පහත කොටස ඇතුළත් විය යුතුය.

"ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගයේ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013.03.15 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ."

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2013 මාර්තු මස 05 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

03-794

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.